# චීනයේ තුන්හුවාන්හි දහස් බුදු ලෙන සම්බන්ධ විමසුමක්

ආර්.එච් දර්ශනී සංචලා*

මධ්‍ය ආසියාව ට අයත් චීනයේ සේද මාවත ආසන්නයේ තුන්හුවාන් නගරයට කිලෝ මීටර 16 ක් පමණ දුරින් පිහිටි විහාර සංකීර්ණය කි. 'දහස් බුදු' ලෙන යන නාමයෙන් හඳුන්වන මෙය ගුහා සංකීර්ණයකි. ක්‍රි.ව. 366 දී පමණ ආරම්භ කළ විහාර සංකීර්ණය කි. පර්වතයක් ඇතුළට සැතපුමක් දුරට හාරා ලෙන් විහාර දහසක් නිර්මාණය කර ඇත. චීන ජාතිකයින් මෙම ලෙන හඳුන්වා ඇත්තේ 'චියැං ගෝතුං' නමිනි. වත්මන වන විට මෙම ගුහා සංකීර්ණයේ ලෙන් 494ක් පමණ යහපත් මට්ටමින් පවතී. ලෙන් විහාර සංකිර්ණය තුළ සිතුවම් මෙන්ම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා දානශාලා, පුස්තකාල මෙන්ම භික්ෂූ වාසස්ථාන පිහිටුවා ඇත. විද්වත් මතයට අනුව මෙම නිර්මාණය කිරීම සඳහා වසර දහසක කාලයක් ගත වී ඇත. තුන්හුවාන් දහස් බුදුලෙනෙහි නිර්මාණ ශිල්පය වර්ග කිහිපයකට බෙදෙන අතර ගෘහයන්, පිළිම සිතුවම් ඒ අතර සුවිශේෂ ලක්ෂණයන් විදහාපායි. තුන්හුවාන් දහස් බුදු ලෙනෙහි ගෘහයන් බොහෝ විට බෞද්ධ ආගමික කටයුතු සඳහා නිර්මාණය කර ඇති අතර මධ්‍යම සාකච්ඡා ගුහාව, සමුළු ශාලාව, භාවනා ගුහාව යන විවිධ නම් වලින් මෙම බෞද්ධාගමික වන්දනා ගෘහයන් නම් කොට ඇත. ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා මෙන්න ධර්මය ඉගෙන ගැනීම සඳහා වැඩම කළ බොහෝ උගතුන් ධර්ම ශාස්ත්‍රීය කටයුතු සිදු කළ ස්ථානයක් ලෙස මෙම විහාරය හැඳින්විය හැකිය. මෙහි බෞද්ධ භික්ෂූන්ට ආගමික හා ශාස්ත්‍රීය කටයුතු සඳහා අවශ්‍ය ගෘහ නිර්මාණ සියල්ලක් ම පාහේ ඉදි කළ ඇති අතර ලෙන් විහාරයට යාබදව මෘත දේහ වැළලීම සඳහා සොහොන් බිමක් ද පුරාවිද්‍යා කැණීම් මගින් සොයාගෙන ඇත. තුන්හුවාන් ලෙනෙහි ප්‍රතිමා ගාන්ධාර ආභාසය සහිතව නිමවා ඇති අතර වර්තමානය වන විටදී බොහෝ සංඛ්‍යාවක් සුළඟින් විනාශ වී ඇත. ප්‍රතිමා විවිධ ස්වරූප ගෙන ඇත. බෞද්ධාගමික සිතුවම් ප්‍රතිමා මෙන්ම එකල රාජ්‍ය පරිවාරය සහිත සිතුවම් ප්‍රතිමා දක ගත හැකි මෙම කලා නිර්මාණ තුළින් එකල්හි ආගමික, දේශපාලන, සමාජීය වටපිටාව මැනවින් හඳුනාගත හැකිය. මහායාන බුදු දහමේ බලපෑම මෙන්ම දෙවි දේවතා සංකල්පයන් ද බුදු ලෙනෙහි කලා නිර්මාණයන්ට මුසුව ඇත. කලක් භික්ෂූන් වහන්සේලාගේ ධර්ම ප්‍රචාරක සහ අධ්‍යාපන ශාස්ත්‍රිය කටයුතු සඳහා මහා පින් බිමක් වූ තුන්හුවාන් දහස් බුදු ලෙන අංශයන් කිහිපයකින්ම ඉතා වැදගත් වේ. ශේෂව ඇති කලා නිර්මාණයන් ගම්‍යමාන කරන ශිල්පීය තාක්ෂණය ඉතා සුවිශේෂීය. මෙම වටිනා බෞද්ධාගමික මධ්‍යස්ථානය මුස්ලිම් ආක්‍රමණයන් හේතුවෙන් විනාශ වී ගියද පුරාවිද්‍යාඥයන් මෙම පුද බිම නැවත ලොවට දායාද කළ අතර වත්මන් ලෝක උරුමයක් ලෙසද නම් කොට ඇත.

ප්‍රමුඛ පද - තුන්හුවාන්, බුදුලෙන, නිර්මාණ, කලා

* බෞද්ධ සංස්කෘතික අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය darshanisanchala@gmail.com